Department of Education Sabaragamuwa Province/ Weekly School

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - ආර්ථික විද්‍යාව

සතිය- 9

ශ්‍රේණිය 12

සකස් කළේ - ඒ.එන්.ඩී.අබේසිංහ මිය,ර/මල්වල ම.වි.

**නිපුනතා මට්ටම - 6.1 - සාර්ව ආර්ථික සමතුලිතය හා අසමතුලිතය විග්‍රහ කරයි.**

## සාර්ව ආර්ථික සමතුලිතය යනු

සමස්ත නිමවුමේ වටිනාකමට සමාන සමස්ත ඉල්ලුමක් පවතින අවස්ථාව සාර්ව ආර්ථික සමතුලිතය ලෙස හැඳින්වේ. එනම් සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ත සැපයුමක් ඇති වන අවස්ථාවයි.

- මෙහිදී **සමස්ත නිමවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය නොවී** පවත්නා මට්ටමෙහිම පවතී.

## සාර්ව ආර්ථික අසමතුලිතය යනු

සමස්ත ඉල්ලුම සපුරාලීමට සමත් සමස්ත සැපයුමක් ඇති නොවන අවස්ථාව සාර්ව ආර්ථික අසමතුලිතයයි.

- මෙහිදී **සමස්ත නිමවුමත් සමස්ත සේවා නියුක්ති මට්ටමත් උච්චාවචනය වේ.**

**සාර්ව ආර්ථික සමතුලිතය ඉදිරිපත් කළ හැකි ප්‍රවේශ 03 කි,**

1. සමාහාර ආදායම් = සමාහාර වියදම් ප්‍රවේශය
2. කාන්දු වීම් = විදීම් ප්‍රවේශය
3. සමාහාර ඉල්ලුම් = සමාහාර සැපයුම් ප්‍රවේශය

## සමාහාර ආදායම් සමාහාර වියදම් ප්‍රවේශය

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ සමස්ත ආදායම සමස්ත වියදමට සමාන වීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වීම සමාහාර ආදායම් වියදම් ප්‍රවේශයයි.

## කාන්දු වීම් විදීම් ප්‍රවේශය

කිසියම් කාල පරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ ආදායම් චක්‍රාකාර ප්‍රවාහයෙන් පිට වීම් (කාන්දු වීම්) එකතුවීම් වලට (විදීම්) සමාන වීම යන කොන්දේසිය මත සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වීම කාන්දු වීම් විදීම් ප්‍රවේශයයි.

<u>අභ්‍යාස</u>

1. සාර්ව ආර්ථික සමතුලිතය අර්ථ දක්වන්න
2. සාර්ව ආර්ථික අසමතුලිතය යනු කුමක්ද
3. සාර්වආර්ථික සමතුලිතය නිරූපනය කල හැකි විකල්ප ප්‍රවේශ මොනවාදැයි පැහැදිලි කරන්න